දහනව වන (19) සියවසේ මුල් කාලීන අධ්‍යාපනය (1835 දක්වා)

පූජ්‍ය පාහියංගල සුමංගල හිමි

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නූතන අධ්‍යාපනයට පදනම වැටනුයේ යුරෝපීය ජාතිකයන්ගේ ආගමනයෙනි. යුරෝපීය ජාතිකයන් සියවස් කිහිපයක් පිළිවෙළින් පෘතුගීසීහු 1505 වර්ෂයේ දී සහ ලන්දේසීහු 1656 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ආක්‍රමණය කළහ. සියවස් කිහිපයක් දිවයිනේ මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ ඔවුන්ගෙන් දේශීය ආර්ථිකයට සහ සංස්කෘතියට විවිධ බලපෑම් එල්ල විය. 1796 වර්ෂයේ දී ඉංග්‍රීසි ජාතිකයන් දිවයිනට පැමිණීමෙන් අනතුරු විදේශීය බලපෑම් දැඩි වූ අතර 1815 වර්ෂයේ එතෙක් විදේශිකයන්ට යටත් නො වූ පැවැතුණු සෙංකඩගල රාජධානිය සුදු ජාතිකයන් යටත් කර ගැනීමෙන් පසු ව මුළු දිවයිනේ ම පාලනය ඔවුන් යටතට ගැනීමට හැකි විය. මොවුන්ගේ මුඛ්‍ය අභිමතාර්ථය වූයේ දිවයිනේ සම්පත් උපයෝගී කරගනිමින් ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගීම යි. එම ආර්ථිකයෙන් බ්‍රිතාන්‍ය ආර්ථිකය ශක්තිමත් කිරීමට සහ ඒ සඳහා ඔවුන් විවිධ කර්මාන්ත දිවයිනේ ආරම්භ කිරීමත් එ මගින් සිදු විය. ආර්ථිකයට මෙන් ම දිවයිනේ බොහෝ සමාජ පැතිකඩයනට එනම් විශේෂයෙන් අධ්‍යාපනය සඳහා ආගමික ඉගැන්වීම් මූලික කරගනිමින් විවිධ සංශෝධන ඇති විය. මෙම අධ්‍යාපන සංශෝධනයන් මගින් එතෙක් සාම්ප්‍රදායික ව බෞද්ධ පරිසරයක් තුළ ගොඩනැගී තිබූ දේශීය අධ්‍යාපනය පිරිහෙන්නට විය.

බ්‍රිතාන්‍ය අවධියට පෙර යුරෝපීය අධ්‍යාපන පසුබිම

පෘතුග්‍රීසීහු ලක්දිව පාලනය කළ සමයේ අධ්‍යාපනය සඳහා විශේෂ අවධානයක් යොමු කළහ. මෙම අවධියේ මිෂනාරීන් යටතේ පැවැති අධ්‍යාපනය ප්‍රධාන අභිප්‍රාය වූයේ ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීම සඳහා යොමු වීම ය. ශ්‍රී ලාංකේය රජ කුමරුවරුනට පවා මිෂනාරීන් ලවා අධ්‍යාපනය ලබාදීමට කටයුතු කළ අතර සාමාන්‍ය ජනතාව සඳහා පාසල් සහ විද්‍යාලය පිහිටුවීම ද ආරම්භ කර ඇත. කොළඹ සාන්ත අන්තෝනි විදුහල මේ සඳහා නිදසුන් වේ.

ලන්දේසි පාලන සමයේ දී ශ්‍රී ලංකේය අධ්‍යාපනය නව මුහුණුවරකින් ආරම්භ වූ අතර පාසල් දිවයිනේ බොහෝ ප්‍රදේශවල ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි. ක්‍රි.ව. 1660 වර්ෂයේ දී පමණ වන විට ඔවුන්ගේ පාසල් අරඹන ලදි. මෙම අධ්‍යාපන

ක්‍රමය ආගම් ප්‍රචාරය හා බැඳී තිබුණි. ගම් කීපයකට හෝ එක ගමකට එක බැගින් අධ්‍යාපන ආයතන තිබුණි. එක පාසලක ගුරුවරුන් හතරදෙනෙක් සේවය කළ අතර පාසල් කිහිපයකට කතිසේරුවෙකු බැගින් පත්කර තිබුණි. මවුබසින් ඉගැන්වීම් සිදු කළ අතර විෂයමාලාවේ ප්‍රධාන තැන හිමිව තිබුණේ කියවීම, ලිවීම, අංක ගණිතය, අක්ෂර වින්‍යාසය, භූගෝල විද්‍යාව, ගායනය හා ක්‍රිස්තියානි මූලධර්ම ඉගැන්වීමට ය. ගුරුවරුන් පුහුණුවට කොළඹ නෝමල් නම් පාසලක් තිබුණි. කොළඹ පිහිටි සෙමනේරිය මගින් ලන්දේසි භාෂාවෙන් උසස් අධ්‍යාපනය ලබාදෙන ලදි. පැරිෂ් පාසල් දිවයින පුරා ව්‍යාප්ත වූ අතර රජයේ වියදමින් ඉගැන්වීම් සිදු විය.

බ්‍රිතාන්‍ය පාලන සමයේ මුල් කාලීන අධ්‍යාපනය

1796 දී ශ්‍රී ලංකාවට පැමිණි බ්‍රිතාන්‍යයන් අධ්‍යාපනය පිළිබඳ වැඩි අවධානයක් යොමු නො වූ අතර ඔවුන්ගේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ සිය බල පරාක්‍රමය ව්‍යාප්ත කිරීම හා එය විධිමත්ව ස්ථාපනය කිරීම ය. ලන්දේසීන් විසින් පවත්වාගෙන එනු ලැබූ පාසල් එලෙස ම ක්‍රියාත්මක වූ අතර මිෂනාරි පාසල්වල ආරම්භය සිදු විය. ශ්‍රී ලංකාවේ පාලනය ගෙන ගිය මදුරාසි පාලකයින්ගේ අවසාන සමයේදී සහ 1797 වර්ෂයේ ඇති වූ ගැටුම්කාරි තත්වය සමඟින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිරිහෙන්නට විය. මේ බව ගරු ජේම්ස් කෝඩිනර් දේවගැතිවරයාගේ ලේඛනවල ඉතා හොඳින් විස්තර කර ඇත. **(රුබේරු, 1969; 346).**

> *'ලංකාවේ ලන්දේසි ප්‍රදේශ සියල්ලම 1796 මුල් හරියේ බ්‍රිතාන්‍ය ආයුධ බලයට යටත් විය. ඒවා අල්ලා ගෙන අවුරුදු තුනක් පමණ ගතවන තුරු ම රටවැසියන්ගේ ආගමික සංස්ථාවන් ගැන අලුත් ආණ්ඩුව කිසිම සැලකිල්ලක් දැක්වූයේ නැත. යුරෝපීය පූජකවරු යුධ සිරකරුවන් බවට පත් වූහ. කතිසේරුවරුනට සහ පාසල් ගුරුවරුනට ඉන්පසු වැටුප් නොලැබිණි. මහජනයාගේ ආගමික කටයුතු සහ බාල පරම්පරාවේ අධ්‍යාපනය දුර්වල තත්වකට වැටුණේය. නැතහොත් මුළුමණින්ම අතපසු කරන ලද්දේය.'*

ද්විත්ව පාලන සමයේ එනම් 1798 දී පමණ සිවිල් ආණ්ඩුකාරවරයෙකු වශයෙන් සේවය කළ ප්‍රෙඩ්රික් නෝර්ත් විසින් ක්‍රිස්තියානි ආගම සහ අධ්‍යාපනය දියුණු කිරීම ගැන මහත් උනන්දුවක් දක්වා ඇත. මේ කාලපරිච්ඡේදයේ ලන්දේසි අධ්‍යාපනය ක්‍රමයෙන් විනාශ වෙමින් පැවැති අතර රජයේ වැටුප් නොලැබ ගුරු සේවයේ නිරත වූ ගණන ඉතා අල්ප ය. ගම්වල රෙජිස්ත්‍රාත්වරුන් ලෙස ඔවුනට තිබුණු තත්වය නිසා ඔවුහු නොකඩවා ගුරු වෘත්තියෙහි යෙදුණි. අධ්‍යාපනය හැදෑරීමට සුදුසු ගොඩනැගිලි නොතිබීමත් පැවැතුණු ඒවා ජරාජීර්ණ වීමත් නිසා අධ්‍යාපනය ක්‍රමයෙන් පිරිහීමට ලක්වෙමින් පැවතුණි. නෝර්ත් ආණ්ඩුකාරවරයා අධ්‍යාපනය නගා සිටුවීමට අවස්ථා කිහිපයකදීම උත්සාහ කළ ද එය අසීරු වූයේ ආගම ඉගැන්වීම සඳහා සුදුසු පාදිලිවරුන් නොමැති වීම හේතුවෙනි. ඉංග්‍රීසි ජාතික පාදිලිවරුන් සොයාගැනීමට නො හැකි වීමෙන් මදුරාසි රජයේ සිරබාරයේ සිටි පාදිලිවරුන් දස දෙනෙකු පමණ

නිදහස් කරවාගෙන සේවාව ලබා ගැනීමට හැකිවිය. ලන්දේසි අධ්‍යාපනය පිළිබඳ නෝර්ත් ආණ්ඩුකාරවරයා පැහැදීමෙන් සිටි බව ඔහුගේ ලේඛනවල පැහැදිලිව සඳහන් වේ. **(රුබේරු, 1969; 346)**

> *'ලන්දේසීන් විසින් පටන් ගන්නා ලද වැඩ පිළිවෙළ නිහඬ ව නොකඩ වා අනුගමනය කරන ලද්දේ නම් මුළු (සිංහල) ජාතියම යථා කාලයේදී (අපේ ආගමට) හරවාගත හැකි යැයි විශ්වාස කිරීමට කරුණු තිබිණි.'*

මේ අදහස පෙරදැරි කරගනිමින් ජේම්ස් කෝඩිනර් දේවගැතිවරයා සහ නෝර්ත් ආණ්ඩුකාරවරයා සමග එකතු වී අභාවයට යමින් පැවතුණු පැරිෂ් පාසල් ප්‍රතිසංවිධානය කිරීමට යොමු විය. කෝඩිනර් දේවගැතිවරයාගේ දිවයනට පැමිණි රාජකාරිය වූයේ කොළඹ හට හමුදාවේ දේවගැතිවරයා වශයෙන් වුව ද අතිරේක වශයෙන් සියලු පාඨශාලාවල අධිකාරි සහ පාසල් ගුරු තනතුරු ඉල්ලා ඉදිරිපත් වන්නවුන්ගේ පරීක්ෂකවරයා වශයෙන් ද කටයුතු කිරීමට සිදු විය. 1803 දී පමණ ශ්‍රී ලංකාවට පැමිණි ලන්ඩන් මිෂනාරි සමාගමේ මිෂනාරීන්ගේ ද සහයෝගය ලබාගනිමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිදුකරන ලදි. කෝඩිනර් දේවගැතිවරයා පාඨශාලාධිපති වශයෙන් පත් කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාඨශාලා ක්‍රමයේ ආරම්භය සිදු විය.

මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණයත් සමඟින් සෑම පාසල් ගුරුවරයෙකුට ම මුදල් ගෙවන ලෙස කෝඩිනර් දේවගැතිවරයා ඉල්ලීමක් කළ අතර එම මුදල එක් පාඨශාලාවකට රිදී පගෝදි 08ක වැටුපක් ලෙස විය. **(රුබේරු, 1969; 347)** මෙය යම්තාක් දුරට සුළු වැටුපක් වුව ද පාසල් අධ්‍යාපනය නගා සිටුවීමට ප්‍රමාණවත් විය. පසු ව පැරිෂ් පාසල් පාලනය සඳහා දේශකයන් සහ කතිසේරුවරුන් පත් කිරීමට වැඩපිළිවෙළක් ගෙනගිය අතර එක් ප්‍රධාන නගරයකට එක් දේශකයකු බැගින් පත් කරන ලදි. මෙම පාසලක ගුරු මණ්ඩලය විශාල නො වූ අතර වැඩිම හතර දෙනෙක් විය. සිසුන් සංඛ්‍යාව අනුව ගුරු මණ්ඩලය වෙනස් විය. පැරිෂ් පාසලේ විෂයමාලාව කියවීම, ලියවීම, අංක ගණිතය හා කථෝපකථනය ඇතුළත් විය. මාතෘ භාෂාවෙන් අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව මෙහි දී උදාවූ අතර ආගමික විෂයමාලාව ගම්බද ළමුන්ට ඉගැන්වීම මූලික පරමාර්ථය විය. මෙහි විශේෂත්වය වන්නේ ගැහැනු ළමුන්ට වඩා පිරිමි ළමුන් අධ්‍යාපනය සඳහා වැඩි නැඹුරුවක් තිබීම යි. පාසල් පවත්වා ගෙනයාම සඳහා රජයේ උනන්දුව පැවතුණ ද අධ්‍යාපනය හැදෑරීම සඳහා පාසලට පැමිණියේ අතලොස්සක පිරිසකි. පසු ව නෝර්ත් ආණ්ඩුකාරවරයා විසින් සියලු රෙපරමාදු දෙමව්පියන් තම දරුවන් පාසල් යැවිය යුතු ය යි අණ කරමින් ගැසට් නිවේදනයක් මගින් ආඥාවක් පළ කිරීම හේතුවෙන් යම්තාක් දුරට පැරිෂ් පාසල් පද්ධතිය සාර්ථක කර ගැනීමට හැකි විය.

නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ මැදිහත් වීම මත උසස් පාඨශාලා ක්‍රමයක් ආරම්භ කළ අතර එමගින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වයක් ඇති සිසුන් කිහිප

දෙනෙකුට එංගලන්තයට ගොස් එහි විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය හැදෑරීමට ශිෂ්‍යත්ව පිරිනමන ලදි. මූලික පාඨශාලාවෙන් ඉංග්‍රීසි අධ්‍යාපනය සහ දේශීය භාෂා හා කලා විෂයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර අවුරුදු අටක් මෙහි අධ්‍යාපනය හැදෑරීමෙන් අනතුරු ව රාජ්‍ය සේවයට සහ උසස් ඇකඩමියට ඉල්ලුම්කරුවන් සූදානම් කිරීමත් මෙ මගින් සිදු විය. මෙම උසස් ඇකඩමිය සෙමිනේරිය නමින් ද හැඳින් වූ අතර සිංහල පාඨශාලාව, දෙමළ පාඨශාලාව සහ යුරෝපීය පාඨශාලාව යනුවෙන් පාඨශාලා තුනක් ඇතුළත් විය. කොළඹ ප්‍රදේශයේ එකම ගොඩනැගිල්ලේ මෙම පාඨශාලා තුන ම පිහිටා තිබුණු අතර සාමකාමී ව අධ්‍යාපනය හදාරා ඇත. ඇකඩමිය මගින් ශිෂ්‍යයන් සඳහා නවාතැන් ආහාර අධ්‍යාපනය පමණක් නො ව ඇඳුම් පැළඳුම් පවා නො මිලයේ සැපයිණි. පසු ව මුදල් ගෙවා අධ්‍යාපනය ලැබීමට ද සිසුන්ට අවස්ථාව උදාවිය. 1802 පමණ වන විට නේවාසික සිසුන් 36ක් ද, මුදල් ගෙවා අධ්‍යාපනය හැදෑරූ සිසුන් සංඛ්‍යාව 49ක් ද වූ අතර එම වර්ෂය තුළ දී ම සිසුන් දෙදෙනකු කොළඹ පළාතේ උසාවියේ තෝල්කවරුන් හැටියට තෝරාගැනීමට හැකි විය. තවද නෝර්ත් ආණ්ඩුකාරවරයා විසින් මුස්ලිම් පාඨශාලා (මද්රාසා) ඇති කරමින් මුස්ලිම්වරුන්ට ද අධ්‍යාපනය ලබා දීමට කටයුතු කර ඇත.

1803 පමණ වන විට නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය නිසා අධික මුදලක් රජයට දැරීමට සිදු වූ හෙයින් බ්‍රිතාන්‍යයේ රාජ්‍ය ලේකම්වරයා විසින් මහරජාණන්ගේ උපදෙස් පරිදි අධ්‍යාපනය සඳහා පවුම් 1500කට වඩා මුදලක් වියදම් කිරීමට නො හැකි බව දන්වා සිටින ලදි. මෙ මගින් මෙතෙක් සාර්ථක ව සිදු කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය අතරමග නවතා දැමීමට සිදු වූ අතර පාසල් බොහෝ ප්‍රමාණයක් වසා දැමීමත් ගුරුවරුන්ට වැටුප් ගෙවීමත් නතර කරන ලදි. නෝර්ත් ආණ්ඩුකාරවරයා සහ කෝඩිනර් දේවගැතිවරයා යළි තම දිවයිනට පැමිණි පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නගා සිටුවීමට රජයේ වගකීමක් බව පවසා උද්ඝෝෂණයක් ද සිදු කර ඇත.

නෝර්ත් ආණ්ඩුකාරවරයාගෙන් පසු ශ්‍රීමත් තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ පාලන කාලය තුළ අධ්‍යාපනය සැලකිය යුතු මට්ටමකින් දියුණු වූයේ නැත. රජය මගින් පාඨශාලා හෝ ගුරුවරුන් වැඩි නො කරන ලද අතර වැටුප් ගෙවීම ද තවදුරටත් සිදු නො වී ය. කෙසේ නමුත් පසු කාලීන ව සිදු වූ බලපෑම් මත මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාට අධ්‍යාපනය සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට සිදු වූ අතර එමගින් පාසල් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, පාසල් ගුරුවරුනට වැටුප් ගෙවීම, ඔවුන් පුහුණු කිරීම, පාසල්වල අධ්‍යාපනය තත්වය දියුණු කිරීම වැනි දේ කිරීමට සිදු විය.

මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගෙන් පසු බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා ආණ්ඩුකාර පදවියට පත් වූ අතර මෙම කාලපරිච්ඡේදය ලංකා ඉතිහාසයේ වැදගත් වනුයේ කන්ද උඩරට ප්‍රදේශය 1815 දී බ්‍රිතාන්‍ය කිරීටය යටතට ගැනීම නිසා යටත් විජිතයක් බවට පත්වීම ය. 1818 වර්ෂයේ දී ඇති වූ කැරැල්ල මැඬ පැවැත්වීමෙන් පසු කන්ද

උඩරට ප්‍රදේශවල සම්පූර්ණයෙන් බ්‍රිතාන්‍ය බලය ස්ථාපනය විය. මෙසේ මුළු දිවයින ම බ්‍රිතාන්‍යයන්ගේ යටතට පත්වීමෙන් පසු දිවයින පුරා අධ්‍යාපනය සංවිධානය කිරීමට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාට ඉඩකඩ ලැබුණි. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරායගේ පාලන සමයේ සිදු වූ විශේෂ සිදුවීමක් වන්නේ 1818 වර්ෂයේ දී කොළඹ ආච්ඩීකන් පදවිය ආරම්භ කිරීම යි. ආච්ඩීකන් පදවියක් ඇති කිරීම නිසා ශ්‍රී ලංකාවේ එංගලන්ත සභා ඉතිහාසයේ පළමු වැනි වරට මේ සභාවට නිල බලයක් ලැබුණි. මෙම පදවියට පත්වන ආච්ඩීකන්වරයා ලංකා රජයේ පාඨශාලාවල අධිකාරී තනතුරට නිලබලයෙන් පත් විය. මෙ මගින් එංගලන්ත සභාවට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිපාලනය භාරවීම මේ මගින් සිදු කිරීම පහසු විය.

කෝල්බෲක් කොමිසම සමයේ අධ්‍යාපනය

මෙම අවධියේ ක්‍රිස්තියානි මිෂනාරි සමාගම් විසින් සංවිධානය කරමින් නඩත්තු කරන ලද පාසල් පද්ධතියක් පැවැති අතර ඒවා විවිධ වර්ගවල පාඨශාලා විය. ඒවායේ දෙන ලද අධ්‍යාපනය විවිධ විය. මෙම මිෂනාරි පාඨශාලා යටතේ පැවැති පාඨශාලා ස්වභාෂා පාඨශාලා, ස්වදේශීය පාඨශාලා, ඉංග්‍රීසි පාඨශාලා, මධ්‍යම පාඨශාලා, නිදහස් පාඨශාලා, නේවාසික පාඨශාලා, විද්‍යාලය (කොලීජි) හා සෙමිනේරි යනුවෙන් වර්ග කර දැක්විය හැකි අතර මෙහි සම්පූර්ණ පාලනය මිෂනාරි මණ්ඩලය සතු වූ අතර රජයේ ආධාර නොකඩවා ලැබුණි **(ද සිල්වා, 1969; 362).** 1930 වර්ෂයේ දී කෝල්බෲක් කොමිසම සැකසීම සඳහා දිවයිනේ සෑම ක්ෂේත්‍රයක් ම නියෝජනය වන පරිදි තොරතුරු රැස් කළ අතර ශ්‍රී ලාංකාවේ අධ්‍යාපනය පිළිබඳ ව එමගින් දළ අදහසක් ලබාගත හැකි ය. කෝල්බෲක් කොමිසමට අනුව දිවයිනේ මුළු පාඨශාලා ගණන 640ක් ද, මෙයින් පිරිමි පාඨශාලා 618ක් ද, ගැහැනු පාඨශාලා 12ක් ද, මිශ්‍ර පාසල් 10ක් ද, එහි අධ්‍යාපනය හැදෑරූ සිසුන් සංඛ්‍යාව 8424ක් බවට සඳහන් වේ **(පෙරේරා. 1969; 376).** රෝමානු කතෝලික පාඨශාලා නමින් පෞද්ගලික පාඨශාලා ක්‍රමයක් පැවැති අතර ඒවා ස්ථිර පාඨශාලා නො වී ය. මේවා ශිෂ්‍යන්ගේ පැමිණීම හා ගුරුවරුන්ගේ උනන්දුව අඩුවීම අනුව වසා දමන ලදි. භික්ෂූන් වහන්සේලා විසින් පවත්වන ලද බෞද්ධ පාඨශාලා 1827 වර්ෂය පමණ වන විට 94ක් පැවැතුණි. මේවා දේශීය පාඨශාලා ක්‍රමයට ඉගැන්වීම් සිදු විය. කෝල්බෲක් කොමිසම මගින් පන්සල්වල දෙනු ලබන අධ්‍යාපනය කෙරෙහි එතරම් සැලකිල්ලක් දක්වා නොමැත. පන්සල මුල්කරගත් දේශීය බෞද්ධ අධ්‍යාපනය විනාශ කිරීමට විවිධ උපක්‍රමයන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව කටයුතු කළ අතර, ඒ සඳහා සාමාන්‍ය ජනතාව ආකර්ෂණය කරගත හැකි පරිදි වැඩසටහන් ක්‍රියාත්මක විය.

කෝල්බෲක් කොමිසම මගින් යෝජනා කිහිපයක් අධ්‍යාපනයේ උන්නතිය සඳහා නිර්දේශ කරන ලදි. නමුත් ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හෝ අධ්‍යාපනය නගා සිටුවීමට ප්‍රමාණවත් නො වී ය **(පෙරේරා. 1969; 372-378).**

රාජ්‍ය සේවය උසස් නිලතලවලට පත් වන්නන් සඳහා විශ්වවිද්‍යාලය අධ්‍යාපනයක් ලබා දීම, ඒ සඳහා ලංකාවේ සුදුසු විද්‍යාලයක් ආරම්භ කිරීම, තවද

රාජ්‍ය සේවාව සඳහා සුදුසුකම් ලංකාවේ දී අඩුම වියදමකින් ලබා දීමට ක්‍රියාකිරීමට හැකි බව කෝල්බෲක් යෝජනා කළේ ය.

රජයේ වියදමින් ඉංග්‍රීසි මහාචාර්ය ධුරයක් පවත්වාගෙන යා යුතු බවට නිර්දේශ විය. කොළඹ සෙමිනේරිය මගින් පිටිසර පාසල් සඳහා දක්ෂ ගුරුවරුන් පුහුණු කිරීම ද කෝල්බෲක්ගේ අදහස විය.

දිවයිනේ ආච්ඩීකන්වරයා හා පූජකවරුන් ද, දිස්ත්‍රික්ක භාර රජයේ දිසාපතිවරුන්ගෙන් ද, රජයේ ප්‍රධාන සිවිල් හා අධිකරණ නිලධරයන් ද ඇතුළත් කොමිසමක පාලනය යටතට රජයේ සියලු පාසල් ඇතුළත් කළ යුතු යයි යෝජනා කරන ලදි.

පාසල් ගුරුවරුන් ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්විය හැකි පරිදි ඔවුනට අවශ්‍ය භාෂාව පිළිබඳ මනා නිපුණත්වයක් ලබා දිය යුතු බවට යෝජනා විය. මෙය යම්තාක් දුරට සාර්ථක වූ අතර මෙම පාසල් වර්ගය ඉංග්‍රීසි පාසල් බවට පරිවර්තනය වන්නට විය.

මිෂනාරි සමාගම් විසින් පාලනය කරනු ලබන පාසල් තුළ ඉංග්‍රීසි අධ්‍යාපනය දැනටමත් ලබාදෙන හෙයින් එම ස්ථානවල රජයේ පාසල් තව දුරටත් පවත්වාගෙන යාම අනවශ්‍ය යන්න යෝජනා විය.

මෙ වැනි නිර්දේශ සහ යෝජනා අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ඇති කිරීමට සමත් නො වූ අතර අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කිරීම රජයේ වගකීමක් ලෙස පිළිගැනුණි. කෝල්බෲක්ගේ වාර්තා මගින් ඍජු අවධානය යොමු වූයේ රජයේ වියදම කපා හරිමින් හැකිතාක් ආදායම් ලබාගත හැකි ක්‍රමෝපායන් නිරීක්ෂණය කිරීම යි. ඉක්මන් ලාභයක් ඉපැයිය නො හැකි අධ්‍යාපනය වැනි අංශ කෙරෙහි කෝල්බෲක් කටයුතු කර ඇත්තේ මන්දගාමී ව ය. හුදෙක් ඉංග්‍රීසි භාෂාව සහ ක්‍රිස්තියානි ආගම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1836 වර්ෂයේ දී කෝල්බෲක් කොමිසමේ නිර්දේශවලට අනුව විධිමත් රාජ්‍ය පාසල් ජාලයක් ස්ථාපනය කිරීමට බ්‍රිතාන්‍යයට හැකි විය. 1835 වර්ෂයේ දී පෞද්ගලික පාසලක් ලෙස ආරම්භ වූ කොළඹ ඇකඩමිය, කොළඹ රාජකීය විද්‍යාලය ලෙස පිරිමි දරුවන් සඳහා පූර්ණ ද්විතීයික අධ්‍යාපනය ලබා දෙන මුල් ම රජයේ පාසල බවට 1836 වර්ෂයේ දී පත් කෙරිණි. මෙතැන් සිට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු වෙනත් ප්‍රවාහයක් ඔස්සේ ගමන් කරන්නට විය. මුලින් සඳහන් කළ ලෙස ගම්බද දේශීය අධ්‍යාපනය ක්‍රමයෙන් විනාශ වී ගිය අතර බ්‍රිතාන්‍යයන්ගේ පරිපාලන කටයුතු පහසුව සඳහා පමණක් අධ්‍යාපන කටයුතු ප්‍රතිසංස්කරණය කරමින් ඉංග්‍රීසි භාෂාව සහ ක්‍රිස්තියානි ආගම ඉගැන්වීම් කරමින් ඉදිරියට ගෙන ගියහ.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

රංජිත් රුබේරු. ටී. (2018) **ලංකාවේ අධ්‍යාපනය**, බ්‍රිතාන්‍ය පාලනයේ මුල් අවධියේ අධ්‍යාපනය, I කාණ්ඩය, සියවස ප්‍රකාශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කිංස්ලි එම්. ද සිල්වා (2018) **ලංකාවේ අධ්‍යාපනය**, එංගලන්ත ක්‍රිස්තුධර්ම ප්‍රචාරක ව්‍යාපාරය ලංකාවේ අධ්‍යාපනය කෙරෙහි බලපෑම, I කාණ්ඩය, සියවස ප්‍රකාශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පෙරේරා. එස් ලක්ෂමන් (2018) **ලංකාවේ අධ්‍යාපනය**, කෝල්බෲක් කොමිසම සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, I කාණ්ඩය, සියවස ප්‍රකාශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ගොඩගේ චාල්ස් (2018) **ලංකාවේ අධ්‍යාපනය**, පාඨශාලා කොමිසම, I කාණ්ඩය, සියවස ප්‍රකාශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කුලරත්න ඩබ්. ජී (2002) **ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යුගයේ අධ්‍යාපනය** - (1796 - 1947), සාරා ප්‍රකාශනයෝ, කොට්ටාවඃ

ශ්‍රී ලාංකේය ඉතිහාසය - **IV වෙළුම, ආගමික හා ජාතික පුනරුදය**, සංස්. ඩබ්. එම්. කේ. විජේතුංග, සීමාසහිත ඇම්. ඩී ගුණසේන ප්‍රකාශන, කොළඹ 11ඃ